# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 3 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 පෙබරවාරි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 18.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2022 අංක 3 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

එල්. ඩී.— ඕ. 40/2018

**පුද්ගලනාශක බිම්බෝම්බ භාවිත කිරීම, තොග රැස්කිරීම, නිපදවීම සහ පැවරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

පුද්ගලනාශක බිම්බෝම්බ භාවිත කිරීම, තොග රැස්කිරීම, නිපදවීම සහ පැවරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතියක් 1997 සැප්තැම්බර් මස 18 වන දින ඔස්ලෝහි දී අන්තර්ජාතික පූර්ණ පුද්ගලනාශක බිම්බෝම්බ තහනමක් පිළිබඳ රාජතාන්ත්‍රික සමුළුවේ දී නියම කරගන්නා ලද හෙයින් ද;

එකී සම්මුතිය 2017 දෙසැම්බර් මස 13 වන දින ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් පිළිගෙන ඇති හෙයින් ද;

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැදීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක 3 දරන පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### මූලික

මේ පනත අදාළ වීම

2. මේ පනතේ විධිවිධාන-

(අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යම් නැවක හෝ ගුවන් යානයක ගමන් කරමින් සිටිය දී; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී,

සිදු කරනු ලබන 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් සඳහා අදාළ විය යුතු ය.

වැරදි

3. (1) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, යම් තැනැත්තකු විසින්-

(අ) පුද්ගලනාශක බිම්බෝම්බයක් ලබා ගැනීම, භාවිත කිරීම, සකස් කිරීම, නිපදවීම, ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, මිලදී ගැනීම, සැපයීම, ප්‍රවාහනය කිරීම, අත්කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, රඳවා තබා ගැනීම, තොග රැස්කිරීම හෝ පැවරීම; සහ

(ආ) පුද්ගලනාශක බිම්බෝම්බයක් වෙනත් යම් ආකාරයක පුපුරණ ද්‍රව්‍යයක් බවට වෙනස් කිරීම හෝ පරිවර්තනය කිරීම,

කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තිය උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

ව්‍යතිරේක

4. (1) සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු විසින්, ස්වකීය රැකියාවේ හෝ කාර්යයන්හි නිරතවන අතරතුර දී, බිම්බෝම්බ සොයා ගැනීමේ, බිම්බෝම්බ ඉවත් කිරීමේ, බිම්බෝම්බ නිෂ්ක්‍රීය කිරීමේ හෝ බිම්බෝම්බ විනාශ කිරීමේ ශිල්පීය ක්‍රම සකස් කිරීමේ කාර්ය සඳහා හෝ එම ශිල්පීය ක්‍රම සම්බන්ධයෙන් තැනැත්තන් පුහුණු කිරීමේ කාර්ය සඳහා, 5 වන වගන්තිය යටතේ බලය දෙන ලද පුද්ගලනාශක බිම්බෝම්බයක් ලබා ගැනීම, භාවිත කිරීම, සකස් කිරීම, නිපදවීම, ප්‍රවාහනය කිරීම, අත්කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ පැවරීම කරනු ලැබිය හැකි ය.

(2) 11 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු විසින් ස්වකීය රැකියාවේ හෝ කාර්යයන්හි නිරතවන අතරතුර දී, යම් පුද්ගලනාශක බිම්බෝම්බයක් එකී පුද්ගලනාශක බිම්බෝම්බය නිෂ්ක්‍රීය කිරීමේ හෝ විනාශ කිරීමේ කාර්ය සඳහා තහනමට ගැනීම, ලබා ගැනීම, පැවරීම, අත්කර ගැනීම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබිය හැකි ය.

**5.** (1) බිම්බෝම්බ සොයා ගැනීමේ, බිම්බෝම්බ ඉවත් කිරීමේ, බිම්බෝම්බ නිශ්ක්‍රිය කිරීමේ හෝ බිම්බෝම්බ විනාශ කිරීමේ ශිල්පීය ක්‍රම සකස් කිරීමේ කාර්ය සඳහා හෝ එම ශිල්පීය ක්‍රම සම්බන්ධයෙන් තැනැත්තන් පුහුණු කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් පුද්ගලනාශක බිම්බෝම්බ යම් සංඛ්‍යාවක් රඳවා තබා ගැනීම හෝ පැවරීම සඳහා බලය දෙනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් ඇතැම් කාර්ය සඳහා පුද්ගලනාශක බිම්බෝම්බයක් සඳහා බලය දෙනු ලැබිය හැකි බව

(2) (1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලබන පුද්ගලනාශක බිම්බෝම්බ සංඛ්‍යාව ඉහත සඳහන් කාර්ය සඳහා සම්පූර්ණයෙන්ම අවශ්‍ය වන අවම පුද්ගලනාශක බිම්බෝම්බ සංඛ්‍යාව ඉක්මවනු නොලැබිය යුතු ය.

**6.** (1) පුද්ගලනාශක බිම්බෝම්බයක් ලබා ගනු ලබන, භාවිත කරනු ලබන, සකස් කරනු ලබන, නිපදවනු ලබන, ප්‍රවාහනය කරනු ලබන, අත්කරගනු ලබන, සන්තකයේ තබා ගනු ලබන, රඳවා තබා ගනු ලබන හෝ පවරනු ලබන සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු විසින්:-

තොරතුරු සැපයීම

(අ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයකට අනුව, එකී කටයුතු පිළිබඳ තොරතුරු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, අමාත්‍යවරයා වෙත යැවීම;

(ආ) එකී පුද්ගලනාශක බිම්බෝම්බය සම්බන්ධයෙන් සහ එකී පුද්ගලනාශක බිම්බෝම්බය යොදා ගනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යයට අදාළ වාර්තා තබා ගැනීම;

(ඇ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියකට අනුව, එකී වාර්තාවලින් එකී පුද්ගලනාශක බිම්බෝම්බයට අදාළ කාලීන වාර්තා පිළියෙල කිරීම; සහ

(ඈ) නියම කරනු ලැබිය හැකි කාලසීමාවල දී, එකී කාලීන වාර්තා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යැවීම,

කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, නියමිත අවස්ථානුගත කරුණු යටතේ, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අමාත්‍යවරයා වෙත තොරතුරු යවා ඇති එකී සන්නද්ධ හමුදා සාමාජිකයාගෙන් හෝ පොලිස් නිලධරයාගෙන් විශේෂ වාර්තා ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) සාධාරණ හේතුවක් නොමැතිව (1) වන සහ (2) වන උපවගන්තිවලට අනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන හෝ එසේ කටයුතු කිරීමට අපොහොසත් වන සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

නොමඟ යවන සුළු ප්‍රකාශ සහ ලේඛන

**7.** 6 වන වගන්තිය යටතේ යම් ලේඛනයක් පිළියෙල කිරීමේ දී, දැනදැනම එම ලේඛනයෙහි වැදගත් කරුණු සම්බන්ධයෙන් නොමඟ යවන සුළු ප්‍රකාශයක් කරන හෝ එවැනි යම් වැදගත් කරුණක් ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

## II වන කොටස

### පුද්ගලනාශක බිම්බෝම්බයක් විනාශ කිරීම

රජය විසින් හිමිකාරත්වය හෝ සන්තකය දරනු ලබන පුද්ගලනාශක බිම්බෝම්බ

**8.** 5 වන වගන්තිය යටතේ බලය දෙනු ලබන පුද්ගලනාශක බිම්බෝම්බ සංඛ්‍යාව හැර රජය විසින් හිමිකාරත්වය හෝ සන්තකය දරනු ලබන සියලු පුද්ගලනාශක බිම්බෝම්බ විනාශ කරන බවට ලේකම්වරයා විසින් වගබලා ගනු ලැබිය යුතු ය.

රජයේ ඉඩම්වල ඇති පුද්ගලනාශක බිම්බෝම්බ

**9.** (1) ලේකම්වරයා විසින්, රජය හෝ රජයේ ආයතනයක් විසින් හිමිකාරත්වය දරනු ලබන හෝ පාලනය කරනු ලබන ඉඩම් තුළ පුද්ගලනාශක බිම්බෝම්බ ස්ථානගත කර ඇති බවට දන්නා හෝ සැක කරනු ලබන ප්‍රදේශ හඳුනාගැනීම හෝ හඳුනාගැනීමට කටයුතු සැලැස්වීම සඳහා සෑම ප්‍රයත්නයක් ම දරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන ප්‍රදේශ හඳුනාගනු ලැබූ විට දී, ලේකම්වරයා විසින්, සියලු පුද්ගලනාශක බිම්බෝම්බ විනාශ කරන තෙක්, සඵලදායී ලෙස මහජනයා එම ප්‍රදේශවලින් බැහැර කර තබන බවට වගබලා ගැනීම සඳහා එහි මායිම් රේඛා සලකුණු කිරීම සහ එය අධීක්ෂණය කිරීම සහ වැට බැඳීම් හෝ වෙනත් යම් ආකාරයකින් එම ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා උපරිම ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

**10.** (1) යම් තැනැත්තකු විසින් පුද්ගලනාශක බිම්බෝම්බයක් සොයා ගනු ලැබූ අවස්ථාවක, එකී තැනැත්තා විසින්, වහාම සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු වෙත ඒ පිළිබඳව දන්වනු ලැබිය යුතු ය. — තොරතුරු සැපයීම සඳහා වන වගකීම

(2) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින්, සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ පොලිස් නිලධරයා අදාළ පරිශ්‍රයට පැමිණීමට පෙර, එකී පුද්ගලනාශක බිම්බෝම්බය පුපුරා නොයන බවට වගබලා ගැනීම සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

**11.** (1) පුද්ගලනාශක බිම්බෝම්බයක් යම් පෞද්ගලික පරිශ්‍රයක ඇති බවට සැක කිරීම සඳහා සන්නද්ධ හමුදා සාමාජිකයකුට හෝ පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක එම නිලධරයා විසින්- — පෞද්ගලික පරිශ්‍රවල ඇති පුද්ගලනාශක බිම්බෝම්බ

(අ) එම පරිශ්‍රය භාර තැනැත්තාගේ කැමැත්ත ඇතිව, සියලු සාධාරණ වේලාවන්හි දී එම පරිශ්‍රයට ඇතුළු වීම සහ එම පරිශ්‍රය සෝදිසි කිරීම;

(ආ) එම පුද්ගලනාශක බිම්බෝම්බයක් මගින් ක්ෂණිකව හානියක් සිදුවීම වළක්වා ගැනීම;

(ඇ) එම පුද්ගලනාශක බිම්බෝම්බයට අදාළ අනතුරු ඇඟවීමක්, එම පුද්ගලනාශක බිම්බෝම්බය අසල ඇති යම් දෙයක හෝ ස්ථානයක, පැහැදිළිව පෙනෙන තැනක ඇලවීම;

(ඈ) එම පරිශ්‍රයන් සොයා ගනු ලැබූ හෝ එම පරිශ්‍රයේ ඇති බවට සැක කරනු ලබන පුද්ගලනාශක බිම්බෝම්බයට අදාළ යම් භාණ්ඩයක් හෝ ලේඛනයක් භාරයට ගැනීම;

(ඉ) එසේ කිරීම සාධාරණ ලෙස ප්‍රායෝගික වේ නම්, යම් පුද්ගලනාශක බිම්බෝම්බයක් තහනමට ගැනීම, ඉවත් කිරීම සහ රඳවා තබා ගැනීම;

(ඊ) එම පරිශ්‍රයේ පදිංචි යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම; හෝ

(උ) එම පරිශ්‍රයෙන් සොයා ගනු ලැබූ හෝ එම පරිශ්‍රයේ ඇති බවට සැක කරනු ලබන පුද්ගලනාශක බිම්බෝම්බය

පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම සඳහා සිදු කිරීමට අවශ්‍ය හෝ යෝග්‍ය යම් ක්‍රියාවක් හෝ දෙයක් සිදු කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) සන්නද්ධ හමුදා නිලධරයා හෝ පොලිස් නිලධරයා විසින්, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ කාර්ය පටිපාටිවලට අනුකූලව (1) වන උපවගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) පුද්ගලනාශක බිම්බෝම්බයක් යම් පෞද්ගලික පරිශ්‍රයක ඇති බවට සැක කිරීම සඳහා සන්නද්ධ හමුදා නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක, එකී සන්නද්ධ හමුදා නිලධරයා හෝ පොලිස් නිලධරයා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින්, එකී සැක කටයුතු පුද්ගලනාශක බිම්බෝම්බය පිළිබඳව ලේකම්වරයා වෙත දන්වනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් යම් පෞද්ගලික පරිශ්‍රයක් භාර තැනැත්තකු විසින්, එකී සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ පොලිස් නිලධරයා විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් සහායක් ලබා දෙනු ලැබිය යුතු ය.

(5) ( 1) වන උපවගන්තියේ සඳහන් යම් පරිශ්‍රයක් භාර තැනැත්තකු විසින් එකී පරිශ්‍රයට ඇතුළු වීම සහ එය සෝදිසි කිරීම සඳහා සන්නද්ධ හමුදා සාමාජිකයකුට හෝ පොලිස් නිලධරයකුට ඉඩ ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එකී සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ පොලිස් නිලධරයා විසින්, එම පරිශ්‍රයට අදාළව 13 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන වරෙන්තුවක් යටතේ (1) වන උපවගන්තියේ සඳහන් පරිශ්‍රයට ඇතුළු වීම සහ එය සෝදිසි කිරීම කරනු ලැබිය යුතු ය.

වැරදි

**12.** (1) පුද්ගලනාශක බිම්බෝම්බයක් සොයා ගනු ලැබ ඒ පිළිබඳව සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ පොලිස් නිලධරයකු වෙත දන්වනු ලැබීමට අපොහොසත් වන්නා වූ යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) 11 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරනු ලැබීමේ දී යම් සන්නද්ධ හමුදා සාමාජිකයකුට හෝ පොලිස් නිලධරයකුට විරෝධය දක්වන හෝ බාධා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලබාදෙනු ලබන අනතුරු ඇඟවීමකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබයි.

III වන කොටස

**සාමාන්‍ය විධිවිධාන**

13. දිවුරුමක් මත ලබා දෙන තොරතුරු අනුව- වරෙන්තුව

(අ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් පුද්ගලනාශක බිම්බෝම්බයක් ලබා ගන්නා, භාවිත කරන, සකස් කරන, නිපදවන, ආනයනය කරන, අපනයනය කරන, විකුණන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන, මිල දී ගන්නා, සපයන, ප්‍රවාහනය කරන, අත්කර ගන්නා, සන්තකයේ තබා ගන්නා, රඳවා තබා ගන්නා, තොග රැස්කරන හෝ යම් පරිශ්‍රයන්ට පවරන බවට; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් වන යම් ගනුදෙනුවකට හෝ කටයුත්තකට ඍජුව හෝ වක්‍රව අදාළ වන හෝ සම්බන්ධ වන හෝ, එය ක්‍රියාත්මක කරනු ලැබුවහොත්, මේ පනත යටතේ වරදක් වනු ලබන්නා වූ යම් අපේක්ෂිත ගනුදෙනුවකට හෝ කටයුත්තකට ඍජුව හෝ වක්‍රව අදාළ වන හෝ සම්බන්ධ යම් භාණ්ඩයක් හෝ ලේඛනයක් යම් පරිශ්‍රයක ඇති බවට,

සැක කිරීම සඳහා හේතු ඇති බවට මහෙස්ත්‍රාත්වරයකු සෑහීමට පත්වන අවස්ථාවක දී, ඔහු විසින්, එකී වරෙන්තුවේ දින සිට එක් මසක් ඇතුළත ඕනෑම අවස්ථාවක දී හෝ අවස්ථාවල දී, තම සහායකයන් සමඟ හෝ සහායකයන් නොමැතිව, අවශ්‍ය නම් බලෙන්, එකී වරෙන්තුවේ නම් කරන ලද සන්නද්ධ හමුදා සාමාජිකයකුට හෝ පොලිස් නිලධරයකුට බලය දෙමින් සෝදිසි වරෙන්තුවක් ලබා දෙනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ වන වැරදි මහාධිකරණය විසින් නඩු විභාග කරනු ලැබිය යුතු බව

**14.** වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා කොළඹ දී පවත්වාගෙන යනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයට මේ පනත යටතේ වන වැරදි පිළිබඳව විභාග කිරීම, නඩු විභාග කිරීම සහ දඬුවම් ලබාදීම සඳහා අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ය.

සාමාන්‍ය දණ්ඩන

**15.** (1) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ දෙන ලද යම් විධානයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීමට තැත් කරන හෝ සිදු කිරීමට අනුබල දෙන සෑම තැනැත්තකු ම එම වරදම සිදුකරනු ලබන අතර, ඒ වරද සඳහා වන දඬුවමට සමාන වන දඬුවමකට යටත් විය යුතු ය.

(3) මේ පනත මඟින් ප්‍රකාශිත වෙනත් දඬුවමක් සඳහන් කර නොමැති වූ මේ පනත යටතේ වන යම් වරදක් සිදුකරනු ලබන සෑම තැනැත්තකු ම, වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**16.** මේ පනත යටතේ වන යම් වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන විට-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී එම පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා, සාමාන්‍යාධිකාරිවරයා, ලේකම්වරයා හෝ ඒ හා සමාන වෙනත් නිලධරයකු වශයෙන් සිටි සෑම තැනැත්තකු ම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන්නේ නම්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ දී එම මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම,

එම වරද සිදු කරනු ලබන්නේ ය.

රාජසන්තක කිරීම

**17.** (1) මේ පනත යටතේ වන වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අධිකරණය විසින්, මෙහි මින් පෙර නිශ්චිතව දක්වා ඇති යම් දණ්ඩනයක් පනවනු ලැබිය හැකි අතර, එම අධිකරණය විසින් යෝග්‍ය යයි සිතනු ලබන්නේ නම්, එම වරද සිදු කරන ලද්දේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද, එම භාණ්ඩ සියල්ල හෝ ඉන් කිසිවක් සහ එකී භාණ්ඩ රැගෙන යාම සඳහා භාවිත කරන ලද යම් දෙයක් රාජසන්තක කිරීමට යටත් බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද රාජසන්තක කිරීමේ ආඥාවක්-

(අ) එකී රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත්කර නොමැති අවස්ථාවක එකී ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව;

(ආ) එකී රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, එම රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් අභියාචනාධිකරණය විසින් ලබාදෙන ලද ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් ලබා දෙන ලද එකී ආඥාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව; හෝ

(ඇ) එකී රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ ද, ඉහත පළමුවෙන් සඳහන් කරන ලද අභියාචනය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් ලබා දෙන ලද තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ අවස්ථාවක, එකී රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණයක් දෙනු ලැබීමෙන් පසුව,

බලාත්මක විය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ IX වන කොටසේ XXXVIII වන පරිච්ඡේදයේ විධිවිධාන (1) වන උපවගන්තිය යටතේ රාජසන්තක කරනු ලබන යම් භාණ්ඩයක් බැහැර කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

නියෝග

18. (1) මේ පනතින් නියෝග සෑදීමට බලය දෙන ලද හෝ නියම කරන ලද හෝ නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පනවන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන ලෙස, විශේෂයෙන් අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය-

(අ) පුද්ගලනාශක බිම්බෝම්බයක් ඇති බවට සැක කරනු ලබන පරිශ්‍රවලට ඇතුළු වීමට සහ සෝදිසි කිරීමට අදාළව අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය;

(ආ) පුද්ගලනාශක බිම්බෝම්බයක් සහ ලේඛනයක් රඳවා තබා ගන්නා, තහනමට ගන්නා, ඉවත් කරන සහ විනාශ කරන ආකාරය සහ කාර්යපටිපාටි;

(ඇ) පුද්ගලනාශක බිම්බෝම්බයට අදාළ යම් භාණ්ඩයක් හෝ ලේඛනයක් භාරයට ගැනීම සඳහා අනුගමනය කළ යුතු ආකාරය සහ කාර්යපටිපාටි;

(ඈ) වාර්තාවල ආකෘති සහ අන්තර්ගතය;

(ඉ) එකී වාර්තා තබා ගත යුතු වන කාලසීමාව;

(ඊ) ඉදිරිපත් කරනු ලැබිය යුතු කාලීන වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතය;

(උ) විශේෂ වාර්තා අවශ්‍ය වන අවස්ථානුගත කරුණු සහ එම විශේෂ වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතය;

(ඌ) එම කාලීන වාර්තා සහ විශේෂ වාර්තා පිළියෙල කරනු ලැබිය යුතු අවස්ථාව; සහ

(ළ) එම කාලීන වාර්තා සහ විශේෂ වාර්තාවලට අත්සන් තබනු ලැබිය යුතු තැනැත්තන්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාල සීමාවක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති විරහිතව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ඒ අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රටකට සහාය දීම ආදිය

**19.** මේ පනත යටතේ වන වරදක් පිළිබඳව විමර්ශනය කර නඩු පැවරීමේ කාර්ය සඳහා 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන, ඒ පනත යටතේ ප්‍රකාශයට පත්කරනු ලබන පරිදි යම් රටක් හෝ අන්තර් රාජ්‍ය සංවිධානයක් සඳහා සහාය ලබාදීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"පුද්ගලනාශක බිම්බෝම්බය" යන්නෙන්, යම් තැනැත්තකු පැමිණීමෙන්, අසලට පැමිණීමෙන් හෝ ස්පර්ශ වීමෙන් පුපුරා යන ලෙස නිර්මාණය කර ඇත්තා වූ ද තැනැත්තන් එක් අයකු හෝ ඊට වැඩි දෙනකු අකර්මන්‍ය කරනු ලබන, තුවාල කරනු ලබන හෝ මරණයට පත් කරනු ලබන්නා වූ ද, බිම්බෝම්බයක් අදහස් වේ. තැනැත්තකු නොව වාහනයක් පැමිණීමෙන්, අසලට පැමිණීමෙන් හෝ ස්පර්ශ වීමෙන් පුපුරා යන ලෙස නිර්මාණය කර ඇත්තා වූ ද

ප්‍රතිපාලක උපාංග සහිතව සකස් කර ඇත්තා වූ ද බිම්බෝම්බයක් එසේ සකස් කර තිබීම හේතුවෙන් පුද්ගලනාශක බිම්බෝම්බයක් ලෙස සලකනු නොලැබේ;

"සන්නද්ධ හමුදා" යන්නෙන්, පිළිවෙළින්, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යටතේ පිහිටුවා පවත්වාගෙන යනු ලබන යුද්ධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව අදහස් වේ;

"සම්මුතිය" යන්නෙන්, 1997 සැප්තැම්බර් මස 18 වන දින ඔස්ලෝ හි දී අන්තර්ජාතික පූර්ණ පුද්ගලනාශක බිම්බෝම්බ තහනමක් පිළිබඳ රාජ්‍ය තාන්ත්‍රික සමුළුවේ දී නියම කරගන්නා ලද පුද්ගලනාශක බිම්බෝම්බ භාවිත කිරීම, තොග රැස් කිරීම, නිපදවීම සහ පැවරීම තහනම් කිරීම පිළිබඳ සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය අදහස් වේ;

"රජයේ ආයතනය" යන්නෙන්, යම් අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක්, 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ අර්ථානුකූලව යම් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ යම් පළාත් පාලන ආයතනයක් දරන්නා වූ ද සමාගමක් හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් සහ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් අධිකාරියක් ද ඇතුළත් වේ;

"බිම්බෝම්බය" යන්නෙන්, පොළව හෝ වෙනත් මතුපිට ප්‍රදේශයක් යට, ඒ මත හෝ ඒ අසල ස්ථානගත කර යම් තැනැත්තකු හෝ වාහනයක පැමිණීම, අසලට පැමිණීම හෝ ස්පර්ශ වීම මගින් පුපුරා යන ලෙස නිර්මාණය කර ඇති අත් බෝම්බයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පොලිස් නිලධරයා" යන්නට, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක්, ණයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් මුළු අරමුදලම හෝ මුළු ප්‍රාග්ධනයම නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ; සහ

"පැවරීම" යන්නට, ජාතික භූමි ප්‍රදේශය තුළට හෝ ජාතික භූමි ප්‍රදේශයේ සිට භෞතිකමය වශයෙන් පුද්ගලනාශක බිම්බෝම්බයක් රැගෙනයාමට අමතරව, බිම්බෝම්බයේ හිමිකම සහ ඒ සම්බන්ධයෙන් වන පාලනය පැවරීම ඇතුළත් වන නමුත් ඊට ස්ථානගත කළ පුද්ගලනාශක බිම්බෝම්බයක් ඇති භූමි ප්‍රදේශයක් පැවරීම ඇතුළත් නොවේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.